**වගා කිරීමට සුදුසු ප්‍රභේද**

**දේශීය ප්‍රභේද**

- MIBO 1
- දඹුලු වරණය
- කල්පිටි වරණය

**ආනයනික ප්‍රභේද**

- රාම්පූර් රෙඩ්
- පූසා රෙඩ්
- දෙමුහුම් ප්‍රභේද

**තවාන් සකස්කර ගැනීම හා නඩත්තුව**

- බීජ සිටුවීමට පෙර පැළවීම පරීක්ෂාකර බලා සිටුවීමට ගන්න.
- අක්. 1 ක් සඳහා අවශ්‍ය ලොකු ලූනු බීජ ප්‍රමාණය කි.ග්‍රෑම් 2 - 2.5 ක් පමණ.
- තවාන් පාත්තියක දිග අඩි 10 පළල අඩි 3 හා උස අඟල් 6
- අක්කර 01 කට පැළ ලබා ගැනීම සඳහා මෙවැනි පාත්ති 60 ක් අවශ්‍ය වේ.
- ජීවාණුහරණය කිරීම සඳහා සකස් කරගත් තවාන් පාත්ති හොඳින් තෙමා ජලය බැස ගිය පසු පිදුරු හා දහයියා දමා හොඳින් පුළුස්සන්න.
- ඉතිරි වූ අළු සහ නොපිළිස්සූ ද්‍රව්‍ය ඉවත් කරන්න. කිසිවිටකත් පසට කලවම්වීමට ඉඩ නොහරින්න.
- පාත්තියක් සඳහා බීජ ග්‍රෑම් 35-40 ක් පමණ අවශ්‍ය වේ. (බීජ කි.ග්‍රෑම් 1 කින් පාත්ති 14-15 ක්)
- පාත්තිය මත පළල අතට අඟල් 4 පරතරයක් සහිත ඇලි සාදා අඟල් 1/2 ක් ගැඹුරින් බීජ ඉසින්න.
- සියුම් පස් තට්ටුවකින් වසා වසුන් කර මල් බාල්දියකින් ජලය සපයන්න.
- දින 4-7 කින් වසුන් ඉවත්කර නිර්දේශිත දිලීර නාශකයක් යොදන්න.
- තද හිරු එළියෙන්, පින්නෙන් හා තද වැසි වලින් ආරක්ෂාකර ගැනීමට ලී ආරුක්කු සිටුවා පොලිතින් ආවරණයක් යොදන්න.
- පැළ දුර්වල නම් යූරියා දියකර ඉස, ඉන් පසුව සෝදා හරින්න. (ග්‍රෑම් 15/ ජලය ලී.4.5)
- මාසයකට පසුව පැළ දැඩි කිරීම ආරම්භ කරන්න.
- පොහොර යෙදීම : සම්මත පාත්තියක් සඳහා යූරියා - ග්‍රෑම් 1, ටී.එස්.පී. - ග්‍රෑම් 30, එම්.ඕ.පී. - ග්‍රෑම් 15 ක් යොදන්න. (පාත්ති සකස් කරන විට පසට එකතු කරන්න)
- තවාන් රෝග සඳහා පළිබෝධ පාලනය වැදගත් වේ.
  රෝග - දියමලන් කෑම (නිර්දේශිත පාංශු දිලීර නාශක යොදා පාලනය කරන්න)

**ක්ෂේත්‍රය සකස් කිරීම හා පැළ සිටුවීම**

- සෙ.මී. 20 ක් ගැඹුරට පස පෙරලා සකස් කර ගන්න.
- කුඹුරුවල හොඳින් ජලය බැස යන ලෙස කාණු යොදන්න.
- භූමියට යෝග්‍ය පරිදි උස් පාත්ති, ගිල්වූ පාත්ති හෝ සමතලා බිමෙහි සිටුවීම සිදුකරන්න.
- දහයියා අඟුරු ව.මී. 1 කට ග්‍රෑම් 500 ක් යෙදීමෙන් අස්වැන්න වැඩිකර ගත හැකිය.
- සිටුවීම සඳහා සති 4-5 ක් වයසැති පත්‍ර 3 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇති කුඩා බල්බ සටහන් වී ඇති නිරෝගී බීජ පැළ තෝරාගන්න.
- දිලීර රෝග පාලනය කිරීම සඳහා තිරාම් (ග්‍රෑම් 18) ජලය ලීටර් 10 ක මිශ්‍රකර විනාඩි 30 ක් පමණ ගිල්වා තබන්න.
- පරතරය - අඟල් 4 x 4 හෝ අඟල් 3 x 3, අඟල් 1/2 ක් ගැඹුරින් පැළ සිටුවන්න.

**පොහොර යෙදීම**

**කල්පිටිය ප්‍රදේශය සඳහා පොහොර නිර්දේශය (අක්කරයට කිලෝ ග්‍රෑම්)**

| පොහොර යොදන අවස්ථාව | යූරියා | ඇමෝනියම් සල්ෆේට් | ත්‍රිත්ව සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑෂ් |
|---|---|---|---|---|
| මූලික පොහොර (පැළ සිටුවීමට දින 1,2 කට පෙර) | - | 60 | 40 | 20 |
| සිටුවා සති 3 පසු | 26 | - | - | - |
| සිටුවා සති 6 පසු | 26 | - | - | 10 |

**අනෙකුත් ප්‍රදේශ සඳහා පොහොර නිර්දේශය (අක්කරයට කිලෝ ග්‍රෑම්)**

| පොහොර යොදන අවස්ථාව | යූරියා | ත්‍රිත්ව සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑෂ් |
|---|---|---|---|
| මූලික පොහොර (පැළ සිටුවීමට දින 1,2 කට පෙර) | 26 | 40 | 20 |
| සිටුවා සති 3 පසු | 26 | - | - |
| සිටුවා සති 6 පසු | 26 | - | 10 |

**ජල සම්පාදනය**

- මතුපිට ජල සම්පාදනය
- ක්ෂුද්‍ර ජල සම්පාදනය (බිංදු ජල සම්පාදනය) මගින් ජල සම්පාදනය කළ හැකිය.

**වල් මර්දනය**

- බී ලූනු පැළ සිටුවා පූර්ව නිර්ගමන වල් නාශකයක් යොදන්න
- හැකි අවස්ථාවලදී වසුන් යොදන්න, වල් ගහනය අඩුවේ

## රෝග පළිබෝධ පාලනය

<table>
<tr><th>රෝගය</th><th>පාලනය</th></tr>
<tr><td>තවාන් දියමලන් කෑම</td><td rowspan="7">• ජල වහනය දියුණු කිරීම<br>• රෝගී කොටස් කෙෂ්ත්‍රයෙන් ඉවත් කිරීම<br>• දිලීර රෝග සඳහා නිර්දේශිත දිලීර නාශක යෙදීම</td></tr>
<tr><td>පූර්ව දියමලං කෑම</td></tr>
<tr><td>පශ්චිම දියමලං කෑම</td></tr>
<tr><td>දිලීර මඟින් සිදුවන බල්බ කුණුවීම</td></tr>
<tr><td>බැක්ටීරියා මඟින් සිදුවන බල්බ කුණුවීම</td></tr>
<tr><td>දම් පැල්ලම් රෝගය</td></tr>
<tr><td>ඇන්ත්‍රැක්නෝස්/ඩිස්කෝ පත්‍ර දඟර රෝගය</td></tr>
<tr><th>පළිබෝධ</th><th>පාලනය</th></tr>
<tr><td>පැළ මැක්කා</td><td rowspan="3">• හානි කළ කොටස් ඉවත් කිරීම<br>• කොහොඹ නිස්සාරකය යෙදීම<br>• නිර්දේශිත කෘමිනාශක/ මයිටා නාශක යෙදීම</td></tr>
<tr><td>ලූනු දළඹුවන්</td></tr>
<tr><td>ලූනු බල්බ මයිටාවන්</td></tr>
</table>

## අස්වනු නෙලීම හා සැකසීම

- අස්වැන්න නෙලීමට සති දෙකකට පෙර ජල සම්පාදනය නතර කරන්න
- පත්‍ර කහ පැහැවී, ගෙල කඩා වැටී හා සතියක් පමණ ක්ෂේත්‍රයේ පදම්වීමට ඉඩහැර අස්වනු නෙලා ගැනීම සිදු කරන්න

## පසු අස්වනු

- බල්බයේ ගෙල කොළ පැහැ ඉවත් වී සිහින් වනතුරු වියළා ගන්න
- පදම් කළ බල්බවල වියළි කොළ කපා ඉවත් කරන්න

## ගබඩා කිරීම

- හොඳින් වාතාශ්‍රය ලැබෙන අඳුරු නොවන හා වියළි ස්ථානයක ගබඩා කරන්න
- ලබන කන්නයේ බීජ නිෂ්පාදනය සඳහා බල්බ කොටසක් ඉතිරි කරගන්න

*"කොරෝනා පරදමු - ආහාර අර්බුදය ජය ගනිමු"*

**මුං වගාව පිළිබඳව ඔබට ඇතිවන ගැටළු විසදා ගැනීම සඳහා**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 1920 කෘෂි උපදේශන සේවාවෙන් විමසන්න**

**කෘෂිකර්ම උපදේශක/තාක්ෂණ සහයක/මහවැලි ක්ෂේත්‍ර සහකාර**

| දුරකතන අංකය |
|---|

NAICC Designed by : NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE, Department of Agriculture

**ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන**
**යල කන්නය 2020**

# ලොකු ලූනු වගාව



**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි 2020**